Lesson 40 **(යම් ක්‍රියාවක්) කරන්න ඇති**

මීලග වැදගත් ව්‍යාකරණ පාඩම් තමයි යම් ක්‍රියාවක් “කරන්න ඇති” යන අනුමානය ඉදිරිපත් කරන ව්‍යාකරණ රටාව . “
“ඔවුන් යන්න ඇති”
මේ අදහස ඉදිරිපත් කරන්න ඉංග්‍රීස් භාෂාවේ භාවිතා වෙන්නේ may /might have + past participle කියන රටාව

- කතෘ + may/might have + ක්‍රියාව (past participial)
- කතෘ ඒක වචන බහු වචන කුමක් වුවත් මේ රටාව තමයි යෙදෙන්නේ. ක්‍රියාව අනිවාර්යයෙන් past participle වලින් තැබිය යුතුයි

They may have gone by now
ඔවුන් දැන් ගිහින් ඇති

They might have gone by now
ඔවුන් දැන් ගිහින් ඇති

Someone may have taken it
කව්රු හරි ඒක ගන්න ඇති

Someone might have taken it
කව්රු හරි ඒක ගන්න ඇති

ඉහත වාක්‍යය වල may have / might have දෙකෙන් කුමක් යෙදුවත් ඒකම අර්ථය තමයි ලැබෙන්නේ . නමුත් may have යෙදුනොත් ඒ අනුමානය තරමක් ප්‍රබල විය හැකියි

She might have missed the bus
ඇයට බස් එක මිස් වෙන්න ඇති

He may have thought that we are not coming
ඔහු හිතන්න ඇති අපි එන්නේ නෑ කියලා

Their vehicle might have broken on the way
ඔවුන්ගේ වාහනය මගදී කැඩෙන්න ඇති

He may have cut my name off
ඔහු මගේ නම් කපන්න ඇති

She may have forgotten to call you
ඇයට ඔයාට කෝල් කරන්න අමතක වෙන්න ඇති.

He might have left the office early.
ඔහු කාර්යාලයෙන් වේලාසනින් පිටත් වෙන්න ඇති.

They may have reached home by now.
ඔවුන් මේ වෙනකොට ගෙදර ගිහින් ඇති

We might have taken the wrong turn.
අපි වැරදි හැරවීම ගන්න ඇති (අපි වැරදි පාරට හැරෙන්න ඇති )

You may have misunderstood me.
ඔයා මාව වරදවා තේරුම් ගන්න ඇති

She  might have seen you yesterday.
ඊයේ ඇය  ඔයාව දකින්න ඇති

The teacher may have marked our papers.
ටීච(ර්) අපේ පේප(ර්ස්) මාක් කරලා ඇති

She might have lost her phone.
ඇයගේ ෆෝන් එක නැතිවෙලා ඇති

You may have dropped your keys somewhere.
ඔයා කොහේ හරි ඔයාගේ යතුරු වට්ටගන්න ඇති

They might have taken the wrong bus.
ඔවුන් වැරදි බස් එක ගන්න ඇත්තේ (වැරදි බස් එකේ නගින්න ඇත්තේ )

She might have arrived at the station by now.
ඇය මේ වෙනකොට දුම්රිය ස්ථානයට ළඟා වෙලා ඇති.

He may have finished his work already.
ඔහු දැනටමත්  වැඩේ ඉවර කරලා ඇති.

I may have left my bag in the car.
මම මගේ බෑග් එක කාර් එකේ තියල එන්න ඇති

He may have sent you the email by now.
ඔහු මේ වෙනකොට ඔයාට  email එක එවලා ඇති.

She might have learned about the incident already
ඇය දැනටමත් සිද්ධිය ගැන දැනගෙන ඇති

She might have misunderstood what I said
මම කියපු දෙය ඇය  වරදවා හිතන්න ඇති

- මෙහි නැතාර්ථය බලමු

She may not have finished her homework.
ඇය ඇගේ ගෙදර වැඩ ඉවර කරලා නැතුව ඇති.

He may not have noticed the message.
ඔහු මැසේජ් එක දකින්න නැතුව ඇති.

He may not have checked his email yet.
ඔහු තවමත් email චෙක් කරලා නැතුව ඇති.

They might not have heard the announcement.
ඔවුන් නිවේදනය අහන්න නැතුව ඇති. (announce - එනවුන්ස් - නිවේදනය කරනවා)
(Announcement- එනවුන්ස්මන්ට් - නිවේදනය)

She may not have finished her homework.
ඇය ගෙදර වැඩේ ඉවර කරලා නැතුව ඇති.

He may not have seen it
ඔහු ඒක දකින්න නැතුව ඇති.

He may not have taken it
ඔහු ඒක අරගන්න නැතුව ඇති

They may not have gone
ඔවුන් යන්න නැතුව ඇති

He may not have given my message to her
ඔහු මගේ පණිවිඩය ඇයට දෙන්න නැතුව ඇති

He may not have done what I asked him to do
මම ඔහුට කරන්න කියපු දෙය ඔහු කරන්න නැතුව ඇති

I may not have locked the door properly
මම දොර හරියට වහන්න නැතුව ඇති

She might not have understood the instructions
ඇය උපදෙස් තේරුම් නොගන්න ඇති

He may not have received my mail
ඔහුට මගේ මේල් එක නොලැබෙන්න ඇති

They might not have found the place
ඔවුන් තැන හම්බ වෙන්න නැතුව ඇති

She may not have seen me at the party
ඇය පාටියේදී මාව දකින්න නැතුව ඇති

- මීලගට මෙහි ප්‍රශ්නාර්ථය බලමු

මෙහිදී විමසන්නේ අදාළ ක්‍රියාව සිදුවී තිබෙන්ට ඉඩක් ඇතිද ? කියන එක. මෙහිදී may /might වාක්‍යයේ ඉදිරියට එනවා . නමුත් ප්‍රයෝගික භාවිතයේදී may මේ ආකාරයට මේ ප්‍රශ්නය අහන්න යෙදෙන්නේ නැහැ . ඒ නිසා අපි might විතරක් මේ ප්‍රශ්නාර්ථය සදහා ගනිමු. ඒ වගේම තේරුම් දීමේදී මෙහිදී දී තිබෙන්නේ සිංහල ව්‍යවහාරයේ නිතර භාවිතා වන අකාරයෙන්

Might she have missed the bus?
ඇයට බස් එක මඟ හැරෙන්න ඇතිද ?

Might he have finished the work already?
ඔහු දැනටම වැඩේ ඉවර කරලා ඇතිද ?

Might they have taken the wrong train?
ඔවුන් වැරදි දුම්රිය ගන්න ඇතිද ?

Might I have left my keys in the car?
මම මගේ යතුරු කාර් එකේ දාල එන්න ඇද්ද ?

Might she have misunderstood what I said ?
ඇය මම කියපු දේ වැරදියට තේරුම් ගන්න ඇද්ද ?

Might he have forgotten to call you?
ඔයාට කෝල් කරන්න ඔහුට අමතක වෙන්න ඇද්ද ?

Might they have gone by now ?
මේ වෙනකොට ඔවුන් ගිහිල්ල ඇද්ද ?

Might she have seen me yesterday ?
ඊයේ ඇය මාව දකින්න ඇතිද ?

Might someone have taken it away ?
කව්රු හරි ඒක  අරගෙන යන්න ඇද්ද ?

Might she have forgotten her bag at home?
ඇය ඇගේ බෑගය ගෙදර අමතක කරලා එන්න ඇතිද ?

Might he have made a mistake in the report?
ඔහු වාර්තාවේ වැරැද්දක් කරලා තියෙන්න පුලුවන්ද ?

- ඇතැම් විට, මේ තේරුම දෙන්න may / might have යෙදෙන තැනක could have යෙදෙන්නත් පුළුවන් . අනුමානය ප්‍රකාශ කරන්න ඒ වගේ could have + past participle රටාව යෙදෙන තැන් තියෙනවා . මීට කලින් අපි මේ රටාව ඉගෙන ගත්තා "යම් ක්‍රියාවක් කර හැකිව තිබුනා" කියන අදහස දෙන්න . ඊට අමතරව මේ වගේ අනුමානයක් දෙන්නත් ඒ කියන්නේ යම් ක්‍රියාවක් සිදුවෙන්න ඇති කියන අනුමානය දෙන්නත් මේ රටාව පවිච්චි වෙනවා

Someone could have taken your key by mistake
කව්රු හරි වැරදීමකින් ඔයාගේ යතුර ගන්න ඇති

She could have misunderstood what you said
ඔයා කියපු දෙය ඇය වැරදියට හිතන්න ඇති

He could have lost his key somewhere in market
ඔහු මාකට් එකේ කොහේදී හරි ඔහුගේ යතුර නැති කරගන්න ඇති

It could have rained last night
ඊයේ රෑ වහින්න ඇති

She could have taken it you when you weren't looking
ඔයා බලන් නොහිටපු වෙලාවක ඇය ඒක ගන්න ඇති

The children could have broken the vase while playing
සෙල්ලම් කරන කොට ළමයි වාස් එක කඩන්න ඇති

They could have changed their plans at the last minute.
අන්තිම මොහොතේදී ඔවුන් ඔවුන්ගේ සැලසුම් වෙනස් කරන්න ඇති

She could have thought that you were not coming
ඔයා එන්නේ නෑ කියල ඇය හිතන්න ඇති

They could have canceled the event
ඔවුන් ඒ උත්සවය/ වැඩසටහන අවලංගු කරලා ඇති

Their plans could have failed
ඔවුන්ගේ සැලසුම් අසාර්ථක වන්න ඇති

He could have done something to anger her
ඔහු ඇයට කේන්ති යන්න මොනවා හරි කරන්න ඇති (anger -ඇන්ග(ර්) - කෝපය / කෝප ගන්වනවා )

They could already have left before you went there.
ඔයා එතනට යන්න කලින් ඔවුන් ගිහින් තියෙන්න ඇති

- ඉහත සියලුම ව්‍යාකරණ රටාවන් වල ඒ අනුමානයන් ඉදිරිපත් කෙරුණේ සිදු වෙන්න ඇති කියල හිතන ක්‍රියාවන් ගැන , ඒ කියන්නේ අතීත කාලයේ සිදුවෙන්න ඇති කියල

හිතන නමුත් සිදුවුනාද නැද්ද කියලා අපි හරියටම නොදන්න ක්‍රියාවන් ගැන . යම් විදියකින් අපි අනුමානයක් ඉදිරපත් කරන්නේ කිසිසේත්ම සිදු නොවුණු , සිදුවීමට ඉඩකුත් නැති නමුත් මෙසේ සිදුවීමට ඉඩ තිබුනාය කියලා අපි හිතන මනකල්පිත ක්‍රියාවක් ගැන නම් එවිට අපි භාවිතා කරන්නේ would have

- කතෘ + would have + ක්‍රියාව (past participle)
- කතෘ ඒ ක වචන බහු වචන දෙකටම මේ රටාවමයි . ක්‍රියා පදය අනිවාර්යයෙන් past participle විය යුතුයි

He would have died
ඔහු මැරෙන්න තිබුනා

She would have missed the bus
ඇයට බස් එක මග හැරෙන්න තිබුනා

They would have lost their way
ඔවුන් අතර මං වෙන්න තිබුනා

She would have misunderstood me
ඇය මං ගැන වැරදියට හිතන්න තිබුනා

I would have missed that opportunity
මට ඒ අවස්තාව අහිමි වෙන්න තිබුනා

දැන් අපි මේ වාක්‍යය වඩා අර්ථවත් වන ලෙස තවත් අදහස් සම්බන්ධ කරලා ගනිමු

If not for the people who came to his help, he would have died
ඔහුගේ සහායට ආ මිනිසුන් නොවන්න, ඔහු මිය යන්න තිබුනා (if not for - නොවන්නට - මෙය හොද යෙදුමක් )

If she was late another 10 seconds, she would have missed the bus
ඇය තව තත්පර 1 0 ක් පරක්කු වුනා නම්, ඇයට බස් එක මිස් වෙන්න තිබුනා

If I hadn’t come to pick them up, they would have lost their way
මම ඔවුන්ව ගන්න නාවානම්, ඔවුන්ට මග වරදින්න තිබුනා (lose (one ‘s ) way- මග වරදිනවා / අතරමං වෙනවා ) (lose -ලූස් - lost -ලොස්ට් - lost - ලොස්ට් )

If someone that I know hadn’t told me about the vacancy, I would have missed that opportunity
මම දන්නා කෙනෙක් පුරප්පාඩුව ගැන මට නොකිව්වා නම්, මට ඒ අවස්තාව මග හැරෙන්න තිබුනා (someone that I know - මම දන්න කෙනෙක් - මේ පිලිබඳ 48 පාඩමේදී ඔබට ඉගෙන ගැනීමට හැකියි)

I went there as soon as I got the news . Otherwise he would have got into big trouble
මම එතනට ගියා මට ආරංචිය ලැබුණු ගමන් . එහෙම නැත්නම් ඔහු ලොකු අමාරුවක වැටෙන්න තිබුනා

If not for my sister's advice, I would have made a terrible mistake
මගේ සහෝදරියගේ  උපදෙස් නොවන්න, මම බරපතල අත්වැරැද්දක් කරන්න ඉඩ තිබුනා

Luckily she reminded  me, otherwise I would have forgotten about the meeting.
වාසනාවට ඇය  මට මතක් කළා , නැත්නම් මට රැස්වීම ගැන අමතක වෙන්න තිබුනා

If the doctor hadn't arrived on time, the patient would have died.
ඩොක්ට(ර්) වෙලාවට නාවා නම් ලෙඩා මැරෙන්න තිබුනා

We left very early, otherwise we would have missed the bus
අපි ගොඩක් කලින් පිටත් වුනා , නැත්නම් අපිට බස් එක මඟ හැරෙන්න තිබුනා

හොඳින් තෙරුම් ගන්න ඉහත සිදුවීම් එකක් වත් සිදු වූ දේවල් නෙවෙයි , සිදු වෙන්න තිබුනා කියල උපකල්පනය කරන සිදුවීම්

ඉහත සියලුම ව්‍යාකරණ රටාවන් නැවත නැවතත්  හොඳින් අධ්‍යනය කරන්න , මේ බොහෝ ඒවා මුලින්ම ඉගෙන ගනිද්දී තේරුම් ගන්න තරමක් අමාරුයි . නමුත් නැවත  නැවත අධ්‍යනය කරද්දී ඔබට වැටහීමක් ඒවි. මේ අවස්තාවේදී  ඔබට මේ ව්‍යාකරණ රටා ඉතාමත්ම නිරවුල්ව අවබෝධ වීම සහ ඒවා මැනවින් භාවිතා කල හැකි වීම  අපි බලාපොරොත්තු  වෙන්නේ නැහැ . මෙහිදී අපි බලාපොරොත්තු වෙන්නේ ඔබට මේ ව්‍යාකරණ රටා කියවා හෝ අසා අවබෝධ කරගැනීමේ හැකියාව ලබාදීම පමණයි. මේ පාඩම් මාලාවේ දෙවනි කොටසේදී මේවා වඩාත් විස්තරාත්මකව නැවත  අපි විග්‍රහ කරනවා

Lesson 40

## SPOKEN ENGLISH

### Catching Up with a Friend
### මිතුරෙකු හමුවීම

**මෙයත් සාමානය කතාබහක් . මිතුරන් දෙදෙනෙකු මගදී හමුවීම, ඔවුන්ගේ තොරතුරු විමසීම , දෙමව්පියන් ගැන විමසීම සහ යලි හමුවීමට වෙලාවක් යොදා ගැනීම . මේ සංවාදය තුල ඔබට එදිනෙදා කතා බහට යෙදෙන ඉංග්‍රීසි වැකි බොහෝ ප්‍රමාණයක් හමුවේවි . ඒවයින්  ඇතැම් ඒවා ඔබ දැනටමත් දන්නා ඒවා සහ ඇතැම් ඒවා අලුත් ඒවා විය හැකියි . ඒ සියල්ල හොඳින් මතක් තබා ගන්න . ඒ හැම දෙයක්ම ඔබට ඉතාම ප්‍රයෝජනවත්**

A:-  Hello  Damith, good to see you
හලෝ දමිත් , ගුඩ් ටු සී යූ
හලෝ දමිත් , කොච්චර හොඳද දැක්ක එක

B:- Hello Anush, good to see you too
හලෝ අනුෂ්, ගුඩ් ටු සී යූ ටූ
හලෝ අනුෂ්, ඔයාව දකින්න ලැබුනු එකත් හොදයි

A:- So , how are you?
සෝ , හව් ආ (හවා) යූ?
ඉතින් , කොහොමද?

B:- Not bad,you?
නොට් බෑඩ්, යූ?
වරදක් නෑ, ඔයාට?

A:- I am alright. I haven't seen you for a while, where have you been ?
අයෑම් ඕල්රයිට්. අයි හැව්න්ට් සීන් යූ ෆෝ අ ( ෆෝර ) වයිල් , වෙයා(ර්) හැව් යූ බීන් ?
මම හොඳින්. මම ඔයාව දැක්කේ නෑ ටික කාලෙකින් , කොහෙද හිටියේ ?

B:- I was busy with my work So I didn't have time to go out
අයි වෝස් බිසී විත් මයි ව(ර්)ක් සෝ අයි ඩිඩ්න්ට් හැව් ටයිම් ටු ගෝ අවුට්
මම මගේ වැඩත් එක්ක බිසී වෙලා හිටියේ , ඒ නිසා මට වෙලාව තිබුනේ
නෑ එලියට යන්න
I was away from home for sometime , That 's why you didn't see me
අයි වෝස් අවේ ෆ්‍රොම් හෝම් ෆෝ සම්ටයිම් , දැට්'ස් වයි යූ ඩිඩ්'න්ට් සී මී
මම ගෙදරින් පිට හිටියේ ටික කාලයක් , ඒකයි ඔයා මාව දැක්කේ නැත්තේ

A:- Where are you going now ?
වෙයා(ර්) ආ (වෙයාරා) යූ ගොයිං නව් ?
ඔයා කොහෙද යන්නේ දැන් ?

B:- I am just going this way
අයැම් ජස්ට් ගොයිං දිස් වේ
මම නිකන් මේ පැත්තට යනවා

I am just going for a walk , I am going up to the junction
අයැම් ජස්ට් ගොයිං ෆෝ අ වෝක් , අයැම් ගොයිං අප් ටු ද ජංක්ෂන්
මම නිකන් ඇවිදින්න යනවා, මම හන්දියට වෙනකල් යනවා

Then we can walk together having a little chat
දෙන් වී කැන් වෝක් ටුගෙද(ර්) හැවිං අ ලිට්ල් චැට්
එහෙනම් අපිට එකට යතහැකි කයියක් දා ගෙන

A:- By the way, How are your parents now?
හව් ආ යුව(ර්) පේරන්ට්ස් නව්?
ඔයාගේ අම්මටයි තාත්තාටයි කොහොමද දැන්?

B:- They are okay, My mother had a slight fever a few days before. Now it's gone.
දේ ආ ඕකේ. මයි මද(ර්) හැඩ් අ ස්ලයිට් ෆිව(ර්) අ ෆිව් ඩේස් බිෆෝ. නව් ඉට්ස් ගෝන්.
ඒගොල්ලන්ට වරදක් නෑ. අම්මට පොඩි උනක් තිබුණා දවස් කීපයකට කලින්. දැන් ඒක නෑ.

A:- Did you take her to a doctor?
ඩිඩ් යූ ටේක් හ(ර්) ටු අ ඩොක්ට(ර්)?
ඔයා ඇයව ඩොක්ටර් කෙනෙක් ගාවට අරගෙන ගියාද?

B:- Yes, I did ! He gave her some medicine. Everything is ok now.
යස්, අයි ඩිඩ් ! හී ගේව් හ(ර්) සම් මෙඩිසින්. එවරිතිං ඉස් ඕකේ නව්.
ඔව්, (මම ගෙනිච්චා) ඔහු බෙහෙත් වගයක් දුන්නා. හැමදේම හරි දැන්.
(මෙහි did වලින් සංකේතවත් වන්නේ ඊට ඉහත වාක්‍යයේ සදහන් වූ ඒ ක්‍රියාව)

A: How about the father ? Is he still working in his farm ?
හව් අබවුට් ද ෆාද(ර්) ? ඉස් හී ස්ටිල් ව(ර්)කිං ඉන් හිස් ෆාම් ?
තාත්තට මොකද ? ඔහු තාම ඔහුගේ ෆාම් එකේ වැඩ කරනවද ?

B: He is ok but not working in his farm anymore . He rarely goes out now. He has difficulty in walking .
හී ඉස් ඕකේ බට් නොට් ව(ර්)කිං ඉන් හිස් ෆාම් එනිමෝ . හී රෙයාලි ගෝස් අවුට් නව්. හී හැස් ඩිෆිකල්ටි ඉන් වෝකිං
ඔහු හොදින් නමුත් තවදුරටත් ඔහුගේ ගොවිපලේ වැඩ කරන්නේ නෑ .ඔහු කලාතුරකින් එලියට යන්නේ .ඔහුට ඇවිදීමේ අපහසුතාවයක් තියෙනවා (rarely – කලාතුරකින් ) ( anymore - තවදුරටත් ) (difficulty - අපහසුව , අමාරුව )

A: I must come to see them sometime. I haven't seen them for a long time now. I think I last saw them some 5 years before
අයි මස්ට් කම් ටු සී දෙම් සම්ටයිම්. අයි හැවන්ට් සීන් දෙම් ෆෝර ලෝං ටයිම් නව්. අයි තිංක් අයි ලාස්ට් සෝ දෙම් සම් ෆයිව් ඉය(ර්)ස් බිෆෝ
මම වෙලාවක එන්න ඕනා ඒගෝල්ලන්ව බලන්න. මම ගොඩක් කාලෙකින් ඒගොල්ලන්ව දැක්කෙ නෑ. මං හිතන්නෙ මං අන්තිමට ඒගොල්ලන්ව දැක්කෙ අවිරුදු පහකට විතර ඉස්සෙල්ලා

B:- They will be happy to see you.
දේ විල් බී හැපී ටු සී යූ
ඒ ගොල්ලෝ සතුටු වේවි ඔයාව දකින්න

A:- Give my kind regards to them.
ගිව් මයි කයින්ඩ් රිගාඩ්ස් ටු දෙම්.
මම ඒගොල්ලන්ව මතක් කලා කියන්න

(මේ ආකාරයට යමෙකුට ඔබේ regards දෙන්න කියන එකෙන් අදහස් කරන්නෙ

ඔවුන්ට ඔබේ මිතශීලී හැඟීම් හෝ සුබපැතුම් පිරිනමන්න හෝ ඔබ ඔවුන්ව මතක්
කල බව දන්වන්න කියන එක)

By the way , how is your brother in England ?
බයි ද වේ , හව් ඉස් යුව(ර්) බ්‍රද(ර්) ඉන් ඉංග්ලන්ඩ් ?
ඒක නෙවෙයි , එංගලන්තේ ඉන්න ඔයාගේ සහෝදරයට කොහොමද ?

B:- He is doing well . After completing his studies he works in a private firm . He is married to an English lady . They have one child, a daughter and now his wife is expecting her second child
හී ඉස් ඩුයිං වෙල් . ආෆ්ට(ර්) කම්ප්ලීටිං හිස් ස්ටඩීස් හී ව(ර්)ක්ස් ඉන් අ ප්‍රයිවට් ෆ(ර්)ම් .හී ඉස් මැරිඩ් ටු ඇන් ඉංග්ලිෂ් ලේඩි , දේ හෑව් වන් චයිල්ඩ්, අ ඩෝට(ර්) ,නව් හිස් වයිෆ් ඉස් එක්ස්පෙක්ටින් හ(ර්) සෙකන්ඩ් චයිල්ඩ්

එයාට හොදයි . ඉගෙනීමේ වැඩ ඉවර කලාට පස්සේ එයා පුද්ගලික ආයතනයක් වැඩ කරනවා . එයා බැඳලා ඉන්නේ ඉංග්‍රීසි නෝනා කෙනෙක් . ඒගොල්ලන්ට එක ළමයෙක් ඉන්නවා , දුවක් , දැන් ඔහුගේ වයිෆ් එයාගේ දෙවැනි ළමයා ලැබෙන්න ඉන්නවා

A:- Wow ! Glad to hear that . We were good friends those days
වව් ! ග්ලාඩ් ටු හියර්) දැට් . වී වර් ගුඩ් ෆ්‍රෙන්ඩ්ස් දෝස් ඩේස්
අපුරුයි ! ඒ ගැන අහන්න සතුටුයි . අපි ඒ කාලේ හොද යාළුවෝ

B:- Yeah , I know you were attending classes together , And you were both interested in cricket a lot
යේහ් , අයි නෝ යු ව(ර්) අටෙන්ඩිං ක්ලාසස් ටුගෙද(ර්) , ඇන්ඩ් යූ ව(ර්) බෝත් ඉන්ටරෙස්ටඩ් ඉන් ක්‍රිකට් අ ලොට්
ඔව් මම දන්නවා ඕගොල්ලෝ එකට පන්ති වලට සහභාගී වුනා , ඒ වගේම ඔය දෙන්නම කිකට් වලට ගොඩක් ආසයි

A:- Yes , we both put in money to buy the “Sports” newspaper every Friday . We collected various posters , stickers of famous cricketers
යස්, වී බෝත් පුට් ඉන් මනි ටු බයි ද ස්පෝට්ස් නිව්ස්පේප(ර්) එව්රි ෆ්‍රයිඩේ . වී කලෙක්ටඩ් වේරියස් පෝස්ට(ර්)ස් , ස්ටික(ර්)ස් ඔෆ් ෆේමස් ක්‍රිකට(ර්)ස්
ඔව්, අපි දෙන්නම සල්ලි දැම්ම හැම සිකුරදම ක්‍රීඩා පත්තරේ ගන්න . අපි ප්‍රසිද්ද ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ එක එක පෝස්ටර් , ස්ටිකර් එහෙම එකතු කලා

B:- You can still see some of those posters on the walls of his room
යූ කැන් ස්ටිල් සී සම් ඔෆ්(සමොෆ්) ද පෝස්ට(ර්)ස් ඔන් ද වෝල්ස් ඔෆ් හිස් රූම්
ඔයාට තාම දකින්න පුලුවන් සමහර පෝස්ට(ර්)ස් ඔහුගේ කාමරේ බිත්ති වල

A:- Really
රියලි
හැබෑට

And he used to write to me once in a while after going abroad . but now we both seem to be busy . We both do not have time to write to each other . I haven't heard from him for a long time now.
ඇන්ඩ් හී යූස්ඩ් ටු රයිට් ටු මී වන්ස් ඉන් අ වයිල් ආෆ්ට(ර්) ගොයින් අබ්‍රෝඩ් .
බට් නව් වී බෝත් සීම් ටු බී බිසී . වී බෝත් ඩූ නොට් හැව් ටයිම් ටු රයිට් ටු ඊච් අද(ර්) . අයි හැව්න්ට් හ(ර්)ඩ් ෆ්‍රොම් හිම් ෆෝ අ ලෝන් ටයිම් නව්

ඔහු රට ගියාට පස්සේ ඉදලා හිටලා මට ලියන්න පුරුදු වෙලා හිටියා , නමුත් දැන් අපි දෙන්නම කාර්ය බහුලයි වගේ. අපි දෙන්නටම වෙලාව නැහැ එකිනෙකට ලියන්න. මට සෑහෙන කාලෙකින් ඔහුගෙන් ආරංචියක් නැහැ

(මෙහි used to කියන්නේ ව්‍යාකරණ රටාවක් , ඒ පිළිබද විස්තර මෙහි දෙවැනි කොටසේ අන්තර්ගතයි . ඉන් අදහස් වෙන්නේ යම් ක්‍රියාවක් ඉස්සර කරන්න පුරුදුව හිටියා , නමුත් දැන් ඒක කෙරෙන්නේ නෑ කියන එක ) ( seem - වගේ පේනවා. මේ රටාව පිළිබද විස්තර මෙහි 42 වන පාඩමේ අන්තර්ගතයි )

B:- Yes , he is a busy man , you know living in Europe isn't easy at all. You have to work hard .
යස්, හී ඉස් අ බිසී මෑන් , යූ නෝ ලිවිං ඉන් යුරෝප් ඉස් නොට් ඊසි ඇටෝල් .
යූ හැව් ටු ව(ර්)ක් හාඩ්
ඔව් , ඔහු කාර්ය බහුල මිනිහෙක් , ඔබ දන්නවා යුරෝපේ ජීවත් වෙන එක ලේසි නෑ. ඔබට සිදුවෙනවා මහන්සියෙන් වැඩ කරන්න

*( මෙහි ඔබට සිදුවෙනවා මහන්සියෙන් වැඩ කරන්න කියන එක ඒ අවස්ථාවේ ඔහු සමග කතා කරන පුද්ගලයා ඉලක්ක කරගෙන කරන ප්‍රකාශයක් නෙවෙයි , මින් කරන්නේ සාමාන්‍ය ප්‍රකාශයක් " මහන්සියෙන් වැඩ කරන්න වෙනවා" . මෙවැනි ප්‍රකාශ හදුන්වා දීමේදී බොහෝවිට you කතෘ විදියට දාලා කියන එක ඉංග්‍රීසි භාෂාවේ බහුලයි )

*(ඒ වගේම living in Europe .. කියන කොටසේ , living කියන එක ක්‍රියා පදයේ "කරමින්" කියන රූපය වශයෙන් නෙවෙයි දීලා තියෙන්නේ . මෙතැනදී එය නාම පදයක් ."ජීවත්වීම" කියන එක ඉන් අදහස් වෙන්නේ . ඕනෑම ක්‍රියා පදයකට ing එකතු කලාම එය නාම පදයක් විදියටත් පාවිච්චි කල හැකියි )

A:- I think I last heard from him about 3 years before . I haven't heard from him ever since
අයි තිංක් අයි ලාස්ට් හ(ර්)ඩ් ෆ්‍රොම් හිම් අබවුට් 3 ඉය(ර්)ස් බිෆෝ . අයි හැව්න්ට් හ(ර්)ඩ් ෆ්‍රොම් හිම් එව(ර්) සින්ස්
මන් හිතන්නේ මට අන්තිමට ඔහුගෙන් අහන්න ලැබුනේ (ලිපියකින්/ දුරකථන ඇමතුමකින් ) අවරුදු 3කට විතර කලින්. එදා ඉදලම මට ඔහුගෙන් ආරංචියක් නැහැ

( hear from (someone) - කියන්නේ ඒ පුද්ගලයාගෙන් ලිපියක් , ටෙලිෆෝන් කෝල් එකක් , පණිවිඩයක් ලැබෙන එකට. අපිට ආසන්න වශයෙන් ඒක සිංහලෙන් කියන්න පුළුවන් ආරංචියක් ලැබෙනවා කියලා )

( ever since - එදා ඉදලම )

Anyway I am very happy for him . Give my warm regards to him too !
එනිවේ , අයෑම් වෙරි හැපී ෆෝ හිම් . ගිව් මයි වෝම් රිගාඩ්ස් ටු හිම් ටූ
කොහොමහරි කමක් නැහැ , මට හරි සතුටුයි ඔහු ගැන . ඔහුටත් මගේ උණුසුම් සුභ පැතුම් පිරිනමන්න

B:- Sure, I will. I will tell him that I met you on the way and we talked about him. He will be very happy to hear about you.
ෂුව(ර්) අයි විල් , අයි විල් ටෙල් හිම් දැට් අයි මෙට් යූ ඇන්ඩ් වී ටෝක්ඩ් අබවුට් හිම් . හී විල් බී වෙරි හැපී ටු හියර්) අබවුට් යූ

අනිවාර්යයෙන්ම , මම ඔහුට කියන්නම් මට මගදී ඔයාව හමුවුනා කියලා සහ අපි ඔහු ගැන කතා කලා කියලා. ඔහු ගොඩක් සතුටු වේවි ඔයා ගැන අහන්න ලැබුනු එක ගැන

B:- By the way, can we meet up sometime this week?
බයි ද වේ, කැන් වී මීට්අප් (මීටප්) සම්ටයිම් දිස් වීක් අනිවාර්යයෙන්! (මම කියන්නම්) ඒක නෙමෙයි, අපිට මේ සතියේ වෙලාවක මුනගැහෙන්න පුළුවන්ද?

A:- Yeah, that's a good idea. What about tomorrow? Tomorrow is a free day for me.
යා, දැට්ස් අ ගුඩ් අයිඩියා. වට් අබවුට් ටුමාරෝ. ටුමාරෝ ඉස් අ ෆ්‍රී ඩේ ෆෝ මී.
ඔව්, ඒක හොඳ අදහස. හෙට මොකද? හෙට මට නිවාඩු දවසක්.

B:- Tomorrow … let me check … sometimes I will be a bit busy tomorrow. How about day after tomorrow
ටුමාරෝ … ලෙට් මී චෙක් .... සම්ටයිම්ස් අයි විල් බී අ බිට් බිසි ටුමාරෝ. හව් අබවුට් ඩේ ආෆ්ට(ර්) ටුමාරෝ?

හෙට ... පොඩ්ඩක් ඉන්න බලන්න … සමහර විට මම හෙට ටිකක් බිසි වේවි. අනිද්දා කොහොමද?

A:- Day after tomorrow…no problem. Day after tomorrow will be possible for me.
ඩේ ආෆ්ට(ර්) ටුමාරෝ .... නෝ ප්‍රොබ්ලම්. ඩේ ආෆ්ට(ර්) ටුමාරෝ විල් බී පොසිබල් ෆෝ මී'
අනිද්දා ... .ප්‍රශ්නයක් නෑ. අනිද්දා මට පුළුවන් වේවි.

B:- Then, let's fix day after tomorrow. what about the time?
දෙන්, ලෙට්ස් ෆික්ස් ඩේ ආෆ්ට(ර්) ටුමාරෝ .වට් අබවුට් ද ටයිම්?
එහෙනම් අපි අනිද්දා දා ගමු. එතකොට වෙලාව?

A:- You know morning hours are not possible for me. We can meet in the afternoon , say 3 or 4 O'clock.
යූ නෝ මෝනි(ර්)නින් අව(ර්)ස් ආ නොට් පොසිබල් ෆෝ මී. වී කැන් මීට් ඉන් ද ආෆ්ට(ර්)නූන් , සේ ත්‍රී ඕ ෆෝ ඔක්ලොක්.
ඔයා දන්නවානෙ උදේ වරුවෙ නම් මට බෑ. අපිට හවස්වරුවෙ හමුවෙන්න පුළුවන්, කියන්නෙ 3, 4 වගේ.

B:- 3 or 4…mm…a bit difficult. But I am free after 5.
ත්‍රී ඕ ෆෝ …. ම් …අ බිට් ඩිෆිකල්ට්. බට් අයෑම් ෆ්‍රී ආෆ්ට(ර්) ෆයිව්.
3-4 … ම් …. ටිකක් අමාරුයි. නමුත් මම නිදහස් පහෙන් පස්සේ.

A:- O.k Then we can meet at about 5.30.
ඕ.කේ. දෙන් වී කැන් මීට් ඇට් අබවුට් ෆයිව් ත(ර්)ටි.
හරි, එහෙනම්, අපිට පහමාරට විතර හම්බවෙන්න පුළුවන්.

B:- Okay 5.30 is fine. I will come to your place by 5.30.
ඕකේ, ෆයිව් ත(ර්)ටි ඉස් ෆයින්. අයි විල් කම් ටු යුව(ර්) ප්ලේස් බයි ෆයිව් ත(ර්)ටි.
හරි, පහමාර හොදයි .පහමාර වෙනකොට මම ඔයාගෙ තැනට එන්නම්.

A:- Perfect ! Give me a call before you leave ,o.k.?
ප(ර්)ෆෙක්ට් ! ගිව් මී අ කෝල් බි ෆෝ යූ ලීව්, ඕ.කේ. ?
නියමයි ! ඔයා පිටත් වෙන්න කලින් මට කෝල් එකක් දෙන්න, හරිද?

B:- Sure ! I will call you when I leave here.
ෂුව(ර්) ! අයි විල් කෝල් යූ වෙන් අයි (වෙනයි) ලීව් හිය(ර්)
සහතිකවම! මම ඔයාට කෝල් කරන්නම් මම මෙහෙන් පිටත් වෙනකොට.

A:- Ok, then ,see you day after tomorrow.
ඕ.කේ. දෙන් සී යූ ඩේ ආෆ්ට(ර්) ටුමාරෝ.
හරි, එහෙනම්, අනිද්දා හම්බ වෙමු

Nice meeting you after so long
නයිස් මීටිං යූ ආෆ්ට(ර්) සෝ ලෝං , දමිත්
ගොඩාක් කාලෙකට පස්සේ ඔයාව හමුවීම සතුටක් දමිත්

B:- It was a pleasure !
ඉට් වෝස් අ ප්ලෙෂ(ර්) !
එක සතුටක් වුනා !

See you. Bye!
සී යූ බායි!

A:- Take care, bye!
ටේක් කෙයා බායි!
(Take care යනු සමු ගැනීමකදී බහුල ලෙස භාවිතා වන යෙදුමක් )

**Vocabulary 40**

Announce – අනවුන්ස් – ප්‍රකාශ කරනවා, නිවේදනය කරනවා

Announcement – අනවුන්ස්මන්ට් – ප්‍රකාශනය, නිවේදනය

Vase – වාස් – මල් බඳුන

Vacant – වේකන්ට් – හිස්,  පුරවා නැති

Vacancy – වේකන්සි – හිස් තැන , රැකියා හිස්වීම

Junction – ජංක්ශන් – මංසන්ධිය

Farm – ෆාම් – ගොවිපල

Collect – කලෙක්ට් – එකතු කරනවා

Famous – ෆේමස් – ප්‍රසිද්ධ

Popular – පොපියුල(ර්) – ජනප්‍රිය

Various – වේරියස් – විවිධ

Regards – රිගාඩ්ස් –  සුභ පැතුම්

Perfect – ප(ර්)ෆෙක්ට් – පරිපූර්ණ , ඉතා  නිවැරදි

Value – වැලියු  – වටිනාකම , අගය

Valley – වැලී  – මිටියාවත

Plateau – ප්ලැටෝ – උස් සමතල භූමිය

In vain – ඉන් වේන් – නිෂ්ඵලව , නිකරුණේ

Vacant – වේකන්ට් – හිස් , පුරප්පාඩු වූ

Vacancy – වේකන්සි – පුරප්පාඩුව

Usual – යූෂුවල් – සාමාන්‍ය , සුපුරුදු

Unusual – අන්යුෂුවල් – අසාමාන්‍ය , අසාමාන්‍ය වූ

Curd – ක(ර්)ඩ් – මුදවාපු කිරි

Treacle – ට්‍රීකල් – කිතුල් / පොල්  පැණි

Tough – ටෆ් – දැඩි , ශක්තිමත් ,අමාරු

Rough – රෆ් – රළු

Beard – බියර්)ඩ් – රැවුල

Tiny – ටයිනි – ඉතා කුඩා

Stink – ස්ටිංක් – දුර්ගන්ධය හමනවා / ගඳ ගහනවා

Stitch – ස්ටිච් – මැහුම / මසනවා

Steam – ස්ටීම් – වාෂ්පය

Rule – රූල් – නියමය / රීතිය

Risk – රිස්ක් – අවදානම

Risky – රිස්කි – අවදානම් සහිත

Ritual – රිචුවල් – චාරිත්‍රය / වත්පිළිවෙත

Roam – රෝම් – එහෙ මෙහෙ ඇවිදිනවා / සැරිසරනවා

Robber – රොබ(ර්) – කොල්ලකාරයා

Robbery – රොබරි – කොල්ලකෑම

Rival – රයිවල් – ප්‍රතිවාදියා / තරඟකරු

Rhythm – රිදම් – තාලය, රිද්මය

Rhythmic – රිද්මික් – තාලානුකූල , රිද්මයානුකූල

Promise – ප්‍රොමිස් – පොරොන්දුව, පොරොන්දු වෙනවා

Pledge – ප්ලෙජ් – ප්‍රතිඥාව, පොරොන්දුව

Proverb – ප්‍රොව(ර්)බ් – ප්‍රස්ථා පිරුළ

Scale - ස්කේල් - තරාදිය

Scale – ස්කේල් – පරිමාණය, මිනුම් දණ්ඩ

Large Scale – ලාජ් ස්කේල් – මහා පරිමාණ,

Small Scale – ස්මෝල් ස්කේල් – කුඩා පරිමාණ

Right-Handed – රයිට් හැන්ඩඩ් – දකුණත්, දකුණු අතින් වැඩ කරන

Left-Handed – ලෙෆ්ට් හැන්ඩඩ් – වමත්, වම් අතින් වැඩ කරන

Gentleman – ජෙන්ට්ල්මන් – මහත්මයා,

Lady – ලේඩි – කාන්තාව, මහත්මිය

King – කිං – රජතුමා

Kingdom – කිංඩම් – රාජධානිය

Queen – ක්වීන් – රැජින

Ostrich – ඔස්ට්‍රිච් – පැස්බරා

Peace – පීස් – සාමය,

Piece – පීස් – කැබැල්ල, කොටස

Penalty – පෙනල්ටි – දඬුවම, දඩය

Perfume – ප(ර්)ෆියුම් – සුවඳ විලවුන්, සුවඳ ද්‍රව්‍ය

Period – පීරියඩ් – කාල පරිච්ඡේදය, කාලය

Reject – රිජෙක්ට් – ප්‍රතික්ෂේප කරනවා

Rejection - රිජෙක්ෂන් - ප්‍රතික්ෂේප කිරීම

Happiness – හැපිනස් – සතුට, සන්තෝෂය

Sadness – සැඩ්නස් – දුක, ශෝකය

Uniform – යුනිෆෝම් – නිල ඇඳුම,

Unfair – අන්ෆෙයා – අසාධාරණ, නොයුක්තිසහගත

Employed – එම්ප්ලෝයිඩ් – රැකියාවක නියුතු, සේවයේ යෙදී සිටින

Unemployed – අන්එම්ප්ලෝයිඩ් – රැකියා විරහිත, සේවය නොමැති

Title – ටයිට්ල් – මාතෘකාව, ශීර්ෂය, පදවිය

Title Deed – ටයිට්ල් ඩීඩ් – ඔප්පුව, අයිතිවාසිකම් ඔප්පුව

Erosion – ඉරෝෂන් – ඛාදනය

Soil erosion - සොයිල් ඉරෝෂන් - පාංශු ඛාදනය

Escape – එස්කේප් – පැන යනවා, ගැලවෙනවා

Evaporate – ඉවැපරේට් – වාෂ්ප වෙනවා

Excellent – එක්සලන්ට් – විශිෂ්ට, ඉතා හොඳ

Exhibition – එක්සිබිෂන් – ප්‍රදර්ශනය

Expire – එක්ස්පය(ර්) – කල් ඉකුත් වෙනවා / මිය යනවා

Expiry date – එක්ස්පයරි ඩේට් – කල් ඉකුත්වන දිනය

Extinct – එක්ස්ටින්ක්ට් – වඳ වී ගිය

Inventory – ඉන්වෙන්ට්‍රි – භාණ්ඩ ලේඛනය, තොග ලැයිස්තුව

Involve – ඉන්වෝල්ව් – සම්බන්ධ කරගන්නවා, (යමකට) පැටලෙනවා, (වරදකට)හසුකරනවා ,පටලනවා

Limb – ලිම්බ් – අතක් හෝ කකුලක්, අවයවයක්

List – ලිස්ට් – ලැයිස්තුව

Litter – ලිට(ර්) – කසළ / කසල දමනවා , හැඩි කරනවා

Load – ලෝඩ් – (බඩු ) පටවනවා

Unload – අන්ලෝඩ් – (බඩු ) බානවා

Lobster – ලොබ්ස්ට(ර්) – පොකිරිස්සා

Loop – ලූප් – වළල්ල, තොන්ඩුව

Impact – ඉම්පැක්ට් – බලපෑම / ගැටීම, ගට්ඨනය

Lump – ලම්ප් – ගුලිය, ගැටය, ගෙඩිය (සිරුරේ)

Luxurious – ලග්ෂූරියස් – සුඛෝපභෝගී

Luxury – ලග්ෂරි – සුඛෝපභෝගීබව , සැප පහසුව